# ජාතික අධ්‍යාපන ආයතනය
# බ්‍රේල් සහතික පත්‍ර පාඨමාලාව - 2017
# ඉල්ලුම් පත් කැඳවීම

ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන උක්ත පාඨමාලාව සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

## ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් :

- අ. පො. ස (සාමාන්‍ය පෙළ) සමත් වීම අනිවාර්ය වන අතර වෙනත් ඕනෑම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහිත රජයේ පාසල්, උපකෘත පාසල්, රජයේ අනුමත පෞද්ගලික පාසල් හා පිරිවෙන් වල ඉගැන්වීමේ කටයුතු වල නියුක්ත ගුරුවරුන් සහ නිලධාරීන්ට ඉල්ලුම් කළ හැකි ය.

- අ පො. ස. (සාමාන්‍ය පෙළ) සමත් දෘෂ්ටි ඌනතා සහිත දරුවන් සිටින දෙමව්පියන් හෝ එම දරුවන් සමග කටයුතු කිරීමට කැමැත්තක් දක්වන ඕනෑම ආයතනයක නිලධාරීන්ට ද ඉල්ලුම් කළ හැකි ය.

**පාඨමාලා කාලය :** මාස 06 කි. දිනකට අධ්‍යයන පැය 06ක් ආවරණය වන පරිදි සති අන්ත දින 24 කි.

**පාඨමාලා ගාස්තුව:** රු. 15000.00 කි

## පාඨමාලාවේ අන්තර්ගතය :

- බ්‍රේල් ඉගැන්වීම පිළිබඳ කුසලතා සංවර්ධනය
- සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා කුසලතා සඳහා බ්‍රේල් භාවිතය
- ගණිතය සඳහා බ්‍රේල් භාවිතය
- බ්‍රේල් ආශ්‍රිත ප්‍රායෝගික කුසලතා සංවර්ධනය
- බ්‍රේල් සඳහා නව තාක්ෂණ භාවිතය

## ඉල්ලුම් කළ යුතු පිළිවෙළ

- ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නම, තනතුර, රාජකාරි හා පෞද්ගලික ලිපිනය, දුරකථන අංකය, උපන් දිනය, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් ඇතුළත් වන සේ තමා විසින් පිළියෙල කර ගත් ඉල්ලුම්පතක්, මහරගම ලංකා බැංකුවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 607628 දරන ගිණුමට බැරවන සේ දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකට රු.200/ මුදලක් ගෙවා ලබා ගත් කුවිතාන්සිය සමග **''අධ්‍යක්ෂ, අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම''** යන ලිපිනයට 2017 **ජනවාරි මස 25** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.(මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ) ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ බ්‍රේල් **සහතික පත්‍ර** පාඨමාලාව - 2017 '' යනුවෙන් සඳහන් කළ යුතුයි.

## පාඨමාලාවට තෝරා ගැනීම

- සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
2016.12.23